**සීමාසහිත ගල් ඔය වැවිලි පුද්ගලික සමාගම - 2016/2017**

---

සීමාසහිත ගල් ඔය වැවිලි පුද්ගලික සමාගමේ 2017 මාර්තු 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 මාර්තු 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) වගන්තිය ප්‍රකාරව මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව මා විසින් පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළ යුතු යැයි අදහස් කරන සමාලෝචිත වර්ෂයේ සමාගමේ ක්‍රියාකාරිත්වය සම්බන්ධයෙන් වූ මාගේ නිරීක්ෂණ මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

---

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

---

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාලවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදා ගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 සමාගම පිහිටුවීම හා සමාගමේ අයිතිය

---

සීමාසහිත ගල් ඔය වැවිලි පුද්ගලික සමාගම 2007 අංක 07 දරන සමාගම් පනත යටතේ 2008 සැප්තැම්බර් 19 දින සංස්ථාගත කරන ලද සීමිත සමාගමක් වේ. මෙහි හිමිකාරීත්වයෙන් සියයට 51 ක් රජය සතුවේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

-----------------

### 2.1 මතය

--------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 මාර්තු 31 දිනට සීමාසහිත ගල්ඔය වැවිලි පුද්ගලික සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරිත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.1.1 අනෙකුත් නීති හා නියාමන අවශ්‍යතා මත වාර්තාව

---------------------------------------------------

(අ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තිය ප්‍රකාරව මා විසින් පහත ප්‍රකාශ කරමි. මතය සඳහා වන පදනම හා විෂය පථය සහ විගණනයේ සීමාවන් ඉහතින් ප්‍රකාශ කළ පරිදි වේ.

(ආ) - විගණනය සඳහා අවශ්‍ය සියළුම තොරතුරු සහ කරුණු මා විසින් ලබාගෙන ඇති අතර මාගේ පරීක්ෂණවලින් පිළිබිඹු වන පරිදි, සමාගම විසින් විධිමත් ලෙස ගිණුම් වාර්තා පවත්වා ඇති බවත්,

- සමාගමේ මූල්‍ය වාර්තා 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 වගන්තියෙහි අවශ්‍යතාවයන්ට අනුකූල වන බවත් මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

------------------------------------------

### 2.2.1 සමාගමේ අඛණ්ඩ පැවැත්ම

--------------------------------

2006/2007 මූල්‍ය වර්ෂයේ සිට සමාගම අලාභ ලබමින් පවත්වා ගෙන ගොස් ඇති අතර 2006/2007 වර්ෂයේදී රු. මිලියන 219 ක් වූ එම අලාභය වසර 10 කට පසු එනම් සමාලෝචිත වර්ෂය වන විට රු. මිලියන 949 ක් දක්වා සීඝ්‍ර ලෙස වැඩිවී තිබුණි. සමාගම පත්ව ඇති මෙම අයහපත් මූල්‍ය තත්ත්වය නිසා ඉහල පොලී අනුපාතවලට විශාල වශයෙන් ණය ලබා ගැනීමට සිදු වී තිබුණි. මේ නිසා සමාගමේ අඛණ්ඩ පැවැත්ම අවිනිශ්චිත වී තිබුණි. සමාගමේ සියයට 51 ක කොටස් හිමිකාරීත්වය ඇති රජය වෙනුවෙන් මෙම කටයුතු අධීක්ෂණය කරනු ලබන මහා භාණ්ඩාගාරය මෙම අයහපත් තත්ත්වය සමාලෝචනය කර ලාභදායි ලෙස ව්‍යාපාරය කරගෙන යෑමට අවශ්‍ය නිර්දේශ ඉදිරිපත් කර නොතිබුණි.

### 2.2.2 සම්බන්ධිත පාර්ශවයන් අතර ඇති ගනුදෙනු හෙළිදරව් නොකිරීම

-----------------------------------------------------------------------

ගල්ඔය වැවිලි පුද්ගලික සමාගම විසින් එහි ආශ්‍රිත සමාගම් දෙකක් මගින් 2007 වර්ෂයේ සිට 2009 අගෝස්තු 28 දක්වා කාලය තුල එකතුව රු.477,056,722 ක ණය ලබාගෙන තිබුණි. එම තොරතුරු මූල්‍ය ප්‍රකාශනවලින් හෙළිදරව් කර නොතිබුණු අතර ඊට අමතරව රාජ්‍ය සමාගමක් වශයෙන් මෙසේ ණය පහසුකම් ලබා ගැනීමට අවශ්‍ය භාණ්ඩාගාර අනුමැතියද ලබාගෙන නොතිබුණි.

### 2.2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මූල්‍ය ප්‍රකාශනවල වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු ශේෂ යටතේ දක්වා තිබූ ජාතික ජල සම්පාදන සහ ජලාපවහන මණ්ඩලයෙන් අයකර ගත යුතු වසරකට වඩා පැරණි රු.795,795 ක් වූ ශේෂය අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ආ) සමාගමෙහි මූල්‍ය ප්‍රකාශනවල ගෙවිය යුතු පරිපාලන වියදම් තුල දක්වා ඇති රු. 2,088,899 ක දඩ සහ අධිභාර ශේෂය හා වෙළඳ හා අනෙකුත් ගෙවිය යුතු ශේෂ යටතේ දක්වා තිබූ වසරකට වැඩි කාලයක් තිස්සේ පවතින රු. 144,607 ක්වූ නොගෙවූ වේතන (unclaimed wages) සමාලෝචිත වර්ෂය අවසන් වන විටත් නිරවුල් කර නොතිබුණි.

### 2.2.4 නීති රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම්

පහත සඳහන් නීති රීති, රෙගුලාසි සහ **කළමනාකරණ තීරණ**වලට අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 2007 අංක 07 දරන සමාගම් පනතේ 220 ඡේදය | සමාගමක ශුද්ධ වත්කම් එම සමාගමේ ප්‍රකාශිත ප්‍රාග්ධනයෙන් හරි අඩකට වඩා අඩු වන විට, සමාගමේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් වැඩ කරන දින 40 ක් ඇතුලත සමාගමේ කොටස් හිමියන්ගේ අති විශේෂ මහා සභා රැස්වීමක් පැවැත්විය යුතුය. 2006/2007 සමාගම ආරම්භක දින සිටම ශුද්ධ වත්කම් සෘණ අගයක් ගෙන තිබුණද එම මූල්‍ය වර්ෂයේ සිට 2011/2012 මූල්‍ය වර්ෂය දක්වා එසේ අතිවිශේෂ මහා සභා රැස්වීමක් පවත්වා නොතිබුණි. 2012/2013 වර්ෂයේ සිට එම රැස්වීම පවත්වා තිබුණද එය දින 40 ක් තුල පවත්වා නොතිබුණි. 2015/2016 මූල්‍ය වර්ෂයේ සමාගමේ ශුද්ධ වත්කම් රු. 2,108,168,227 ක සෘණ අගයක් පැවතිය ද අති විශේෂ මහා සභා රැස්වීම පවත්වා තිබුණේ 2017 පෙබරවාරි 23 දින දී ය. |
| (ආ) 1980 අංක 46 දරන සේවක භාරකාර අරමුදල් පනතේ 16(1) වගන්තිය | සේවායා විසින් සෑම මාසයකම සේවයේ නියුතු සේවකයන් වෙනුවෙන් සේවක භාරකාර අරමුදලට ගෙවීමට ඇති මුදල ඊට පසු මාසයේ 30 වන දිනට පෙර ගෙවිය යුතු වුව ද සමාගම විසින් 2016 ජුනි, අගෝස්තු හා සැප්තැම්බර් මාසයන්ට අදාල මුදල් නියමිත පරිදි ගෙවා නොතිබීම හේතුවෙන් රු. 95,965ක අධිභාර ගෙවීමට සිදුවී තිබුණි. |
| (ඇ) 2008 ජනවාරි 25 දිනැති අංක 1533/16 දරන අතිවිශේෂ ගැසට් පත්‍රය | ජාතික පාරිසරික පනතේ විධිවිධාන අනුව සීනි හා එතනෝල් නිෂ්පාදන කර්මාන්තශාලාව සඳහා පරිසර ආරක්ෂණ බලපත්‍රයක් ලබා ගත යුතු වුවද සමාගම විසින් එසේ බලපත්‍රයක් ලබාගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

## 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂය සඳහා ආයතනයේ මූල්‍ය ප්‍රතිඵලය රු.966,946,320 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.905,767,924 ක් වීමෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.61,178,396 ක පිරිහීමක් පෙන්නුම් කෙරුණි. දළ ලාභය රු. 206,411,005 කින් වැඩි වුවද ශුද්ධ මූල්‍ය පිරිවැය, ඉකුත් වර්ෂයට සාපේක්ෂව රු. 210,884,819 කින් එනම් සියයට 39 කින් වැඩිවීම, මූල්‍ය ප්‍රතිඵලයෙහි පිරිහීම කෙරෙහි ප්‍රධාන වශයෙන් බලපා තිබුණි.

## 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයේ දී සමාගමෙහි ජංගම වත්කම් හා ක්ෂණික වත්කම් අනුපාතය පිළිවෙලින් 0.28:1 ක් හා 0.14:1 ලෙස අවාසිදායකව නිරූපණය වන අතර ජංගම වගකීම් හිළව් කිරීමට ප්‍රමාණවත් ද්‍රවශීල වත්කම් මෙන්ම ජංගම වත්කම්ද නොමැති බව නිරීක්ෂණය විය.

(ආ) සමාගමෙහි සියයට 19.6 ක දළ ලාභ අනුපාතයක් නිරූපණය වන නමුත් සියයට 95.9 ක ඉහල ශුද්ධ අලාභ අනුපාතයක් නිරූපණය විය.

(ඇ) සමාගමෙහි 1.86 ක අහිතකර තෝලන අනුපාතයක් නිරූපනය වන අතර මුළු වගකීම් හිලව් කිරීමට ප්‍රමාණවත් මුළු වත්කම් ප්‍රමාණයක් ආයතනය සතුව නොපවතින බව නිරීක්ෂණය විය.

(ඈ) සමාලෝචිත වර්ෂය වන විට සමාගමේ මුළු වත්කම් ඉක්මවූ ණය ප්‍රමාණය රු.3,064,962,691 ක්වූ අතර එය පෙර වර්ෂයට සාපේක්ෂව සියයට 45 ක වැඩි වීමකි. සමාගමේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සපුරා ගැනීමට අවශ්‍ය මුදල්, ණය වශයෙන් ලබා ගත්තද, එම ණය පියවීමට තරම් ප්‍රමාණවත් ආදායමක් සමාගමේ කර්මාන්තශාලාව තුළින් ජනනය වී නොතිබුණි.

(ඉ) සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනවල රු. 250,576,425 ක බැංකු අයිරාවක් වූ අතර වර්ෂය තුළදී අයිරා පොලී ලෙස රු.16,702,149 ක් ගෙවා තිබූ බැවින් කාරක ප්‍රාග්ධන කළමනාකරණය සතුටුදායක නොවීය.

## 3.3 සමාගමට එරෙහිව හෝ සමාගම විසින් ආරම්භ කර ඇති නෛතික සිද්ධි

ප්‍රවර්තන වර්ෂය අවසාන වන විට සමාගමට එරෙහිව බාහිර පාර්ශවයන් විසින් නඩු 14 ක් පවරා තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

---

**4.1** **කළමනාකරණ ක්‍රියාකාරකම්**

---

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සමාගම විසින් තම සම්බන්ධිත පාර්ශවයන්ගෙන් සහ මූල්‍ය ආයතන වලින් සියයට 15 සිට සියයට 28 දක්වා වූ ඉහළ පොළී අනුපාතවලට ණය ලබා ගෙන තිබුණි. සමාගම විසින් සමාලෝචිත වර්ෂය අවසානයට  ලබා ගෙන තිබූ මුළු ණය හා කල් බදු ප්‍රමාණය රු.5,452,164,390 ක් වූ අතර මෙම ණය වෙනුවෙන් ප්‍රවර්තන වර්ෂයේ ණය පොළී වියදම රු.747,416,480 ක් විය.

(ආ) සමාගම සමඟ එළඹ ඇති ගිවිසුම අනුව හෙක්ටයාර 277 ක හිඟුරාන සීනි කර්මාන්තායතනය සතු ඉඩම් 2006 වර්ෂයේදී වර්ෂ 30 ක කාලයකට සමාගම බදු පදනමට ලබා දී තිබූ අතර එම බදු ඉඩම් සඳහා වූ බදු ඔප්පු ලබා දී නොතිබුණි.

(ඇ) සමාගමට වත්කම් පැවරීමේදී ලැබී තිබූ සේවක නිවාස 94 න්  නිවාසලාභීන් 74 දෙනෙකු විසින් එම නිවාස වෙනත් පාර්ශවයන්ට විකිණීම හේතුවෙන් සමාගමට සම්බන්ධයක් නොමැති පුද්ගලයන් පදිංචි වී සිටින අතර තවත් නිවාස 13 ක් පැවරුම්ලාභී පුද්ගලයන් විසින් කුලියට ලබා දී තිබුණි.

(ඈ) හිඟුරාන කම්හල සතුව, උක්වගාව සඳහා උක් වගාකරුවන් 4,441 දෙනෙකුගේ ඉඩම් හෙක්ටයාර් 5,202 ක පමණ භූමි ප්‍රමාණයක් වගාකල හැකිව පවතින අතර 2016 දෙසැම්බර් 31 දින වන විට වගාකර ඇති නව වගාබිම් ප්‍රමාණය සහ නිරි වගා බිම් ප්‍රමාණය පිළිවෙලින්  හෙක්ටයාර 1,401 ක් හා හෙක්ටයාර් 1,378 ක් වශයෙන් මුළු වගා බිම් ප්‍රමාණය හෙක්ටයාර 2,779 ක් විය. මේ අනුව කර්මාන්තශාලාවේ මෙහෙයුම් උපරිම ධාරිතාවයෙන් යුක්තව ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය උක් ප්‍රමාණය ලබා ගැනීමට ප්‍රමාණවත් ඉඩම් සමාගම සතුව තිබුණද, එම ඉඩම් ඵලදායිව යොදා ගැනීමට කටයුතුකර නොතිබුණි.

(ඉ) 2010 -2020 කාලපරිච්ඡේදයට අදාල ව්‍යාපාරික සැලැස්ම අනුව සමාලෝචිත වර්ෂයට අදාලව මූල්‍ය පිරිවැය රු. මිලියන 58 ක් අපේක්ෂා කළ ද සත්‍ය වශයෙන් එය රු. මිලියන 748 ක් වී තිබූ අතර එය සියයට 1,190 ක වැඩිවීමක් විය.

(ඊ) සීනි කර්මාන්ත ශාලාව වැඩිදියුණු කිරීම සඳහා ලබාගෙන තිබූ රු.මිලියන 2,715 ක්වූ ණය මුදලින් එකතුව රු. මිලියන 357.12 ක් ඒවා ලබා ගත් අරමුණුවලට පටහැනිව ණය මුදල් පියවීම සහ ණය පොලී ගෙවීම සඳහා භාවිතා කර තිබුණි.

(උ) කර්මාන්තශාලාවේ සීනි නිෂ්පාදන ක්‍රියාවලියේ අතුරු නිෂ්පාදනයක් වන මොලෑසස් ගබඩා කිරීම සඳහා සමාගමේ දැනට පවතින ගබඩා (VAT) ටැංකි ප්‍රමාණවත් නොවන බැවින් අතිරික්ත ප්‍රමාණය  කර්මාන්තශාලා භූමියේ ඇති වලක් තුළ ගබඩා කර තිබූ අතර එම වලද පිරී පැවතුණි. වර්ෂා ජලය පවා එම මොලෑසස් සමඟ එකතු වීමට ඉඩකඩ තිබූ බැවින් එම මොලෑසස් වල ගුණාත්මක තත්ත්වය රැකගැනීම අවදානමක පැවතුණි.

(ඌ) සමාගමේ කළමනාකරණ කටයුතු සිදු කිරීම, සමාගමේ සියයට 49 ක හිමිකාරිත්වය ඇති ලංකා ඔරික්ස් ලීසින් සමාගම සහ බ්‍රවුන්ස් සහ සමාගම යටතේ පවතින ගල්ඔය හෝල්ඩිංග්ස් සමාගම වෙත කළමනාකරණ ගිවිසුමක් මගින් 2010 අප්‍රේල් 26 දින පවරා තිබුණි. එසේ වුව ද සමාගමේ

දිගින් දිගටම පැවති මූල්‍ය අර්බුදකාරි තත්ත්වයන් මඟ හරවා ගැනීමට සහ කාර්ය සාධනය ඉහල නැංවීමට කටයුතු කිරීමට ගතවූ වසර 7 ක කාලපරිච්ඡේදය තුලදී අවශ්‍ය මඟ පෙන්වීම හා උපදෙස් ලබා දී නොතිබුණි.

(එ) සමාලෝචිත වර්ෂය වනවිට රු. මිලියන 798 ක් වැයකර වැඩ නිමකර ඇති නව ස්කාගාරය ක්‍රියාත්මක කිරීම සඳහා ස්කාගාර බලපත්‍රය ලබා ගැනීමට නොහැකි වී තිබුණි. එම නිසා කර්මාන්ත ශාලාව ක්‍රියාත්මක කල නොහැකි වීමෙන් සමාගමට දිනකට සිදුවන අලාභය (දිනකට ඇස්තමේන්තුගත එතනෝල් අලෙවිය ලිටර 21,500 X ලීටරයක අපේක්ෂිත විකුණුම් මිල රු. 350 බැගින්) රු. මිලියන 7.5 ක් පමණ විය. එමෙන්ම නිෂ්පාදන කටයුතු ආරම්භ කිරීමට නොහැකි වුවද එය පවත්වා ගෙන යාම සඳහා මාසිකව සමාගමට දැරීමට සිදුවන අමතර පිරිවැය රු. 14,172,500 ක් පමණ විය.

## 4.2 මෙහෙයුම් ක්‍රියාකාරකම්

---------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඉකුත් වර්ෂයේ සහ සමාලෝචිත වර්ෂයේ සීනි කිලෝ ග්‍රෑම් එකක නිෂ්පාදන පිරිවැය (COP) පිළිවෙලින් රු. 133 ක් හා රු. 165 ක් වූ අතර සීනි කිලෝ ග්‍රෑම් එකක සාමාන්‍ය වාර්ෂික විකුණුම් මිල පිළිවෙලින් රු.69 ක් හා රු. 100 ක් විය. මෙම නිෂ්පාදන පිරිවැය තුල පිළිවෙලින් රු.37 ක හා රු.60 ක ණය ගැනීමේ පිරිවැයක් ඇතුලත්ව තිබුණි. ඒ අනුව ඒකකයක විකුණුම් මිල ඉක්මවා ඇති නිෂ්පාදන පිරිවැය (COP) අඩු කර ගැනීම සඳහා කෙටි කාලින, මැදි කාලින හා දිගු කාලින වැඩ පිළිවෙලවල් සමාගමේ කළමනාකරණය විසින් ක්‍රියාත්මක කර නොතිබුණි.

(ආ) කර්මාන්තශාලාවේ වාර්ෂිකව ඇඹරීම් කළ හැකි උපරිම උක් ප්‍රමාණය උක් මෙට්‍රික් ටොන් 400,000 (දිනකට 2000 MT × මෙහෙයුම් දින 200) ක් වුවද, 2012/2013 මූල්‍ය වර්ෂයේ සිටම උපරිම ධාරිතාවය ළඟාකර ගැනීමට කර්මාන්තශාලාව අපොහොසත් වී තිබුණි. සමාලෝචිත වර්ෂයේදී කර්මාන්තශාලාවේ අඹරා තිබූ උක් ප්‍රමාණය මෙට්‍රික්ටොන් 146,740 ක් පමණක් වූ බැවින් ධාරිතාවයේ භාවිතය සියයට 37 ක් පමණ විය.

(ඇ) වසර 5 ක දත්ත සංසන්දනය කර බැලීමේ දී ප්‍රවර්තන වර්ෂය වන විට සමාගමේ සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය ක්‍රමයෙන් අඩු වී ඇති අතර 2014/2015 වර්ෂයේ සියයට 8.1 ක් වූ ප්‍රතිශතය සමාලෝචිත වර්ෂය වන විට සියයට 6.7 ක් දක්වා අඩු වී තිබුණි. කර්මාන්තයේ අනෙකුත් තරඟකාරී කර්මාන්තයන් හා සංසන්දනය කර බැලීමේ දී ද සමාගමේ සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය අඩු මට්ටමක පැවති නමුත් මෙම තත්ත්වය මඟහරවා ගැනීමට කටයුතු කර නොතිබුණි.

(ඈ) වසර 5ක දත්ත සංසන්දනය කිරීමේදී ප්‍රවර්තන වර්ෂය වන විට සමාගමේ උක් ගසක පවතින සීනි ප්‍රමාණය ක්‍රමයෙන් අඩු වී ඇති අතර 2012/2013 වර්ෂයේ දී සියයට 10.9ක් ව තිබූ එය සමාලෝචිත වර්ෂය වන විට සියයට 9.1 දක්වා අඩු වී තිබුණි. අනෙකුත් තරඟකාරී ආයතන සමඟ සලකා බැලීමේ දී ද සමාගමේ උක් ගසක පවතින සීනි ප්‍රමාණය අඩු මට්ටමක පැවතුණි.

## 4.3 මතභේදයට තුඩුදෙන ගනුදෙනු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සුරා බදු බලපත්‍රයක් රහිතව (එතනෝල්) මත් පැන් ලීටර 513,000 ක් පෙරා ලග තබා ගැනීම සම්බන්ධයෙන් සමාගමට එරෙහිව සුරා බදු දෙපාර්තමේන්තුව විසින් අම්පාර දිසා අධිකරණයේ පවරන ලද නඩුවේ තීන්දුව ප්‍රකාරව රු. 3,850,000 ක දඩ මුදලක් සමාගමේ අරමුදලින් 2017 ජූනි 08 දින ගෙවා තිබුණි.

(ආ) හිඟුරාන සීනි කර්මාන්තායතනයේ සියලුම දේපල වල අයිතිය රජය සතු වන නමුත් ඊට අයත් පැරණි ස්කාගාර ගොඩනැගිල්ල සමාගම විසින් නව ස්කාගාරය ඉදි කිරීම වෙනුවෙන් ඉවත් කර තිබුණි. එසේ ඉවත් කිරීමට මහා භාණ්ඩාගාරයෙන් අනුමැතියක් ලබාගෙන නොතිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

සමාලෝචිත වර්ෂය අවසානයට සමාගමේ ස්ථිර සේවකයන් 182 දෙනෙකු හා කොන්ත්‍රාත් සේවකයන් 649 දෙනෙකු ඇතුළුව මුළු සේවකයන් 831 දෙනෙකු විය. මෙම කාර්ය මණ්ඩලය කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවෙන් අනුමත කර නොතිබූ අතර බඳවා ගැනීමේ පරිපාටියක් ද අනුමත කරගෙන නොතිබුණි.

## 5. පද්ධති හා පාලනයන්

විගණනයේ දී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සමාගමේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතු වේ.

| | පද්ධති හා පාලන ක්ෂේත්‍ර | නිරීක්ෂණ |
|---|---|---|
| (අ) | දිගු කාලීන ණය ගැනීම් | දිගු කාලීන ණය ශේෂයන් නිරවුල් කිරීමට කටයුතු නොකිරීම. |
| (ආ) | කාරක ප්‍රාග්ධන කළමනාකරණය | කෙටි කාලීන ණය ගැනීම් වැඩි වීම හා ඒ මත අධික පොළී ගෙවීම. |
| (ඇ) | ණයගැති පාලනය | ණයගැති කාල විශ්ලේෂණය පදනම් කරගෙන සිදු කල යුතු බොල් හා අඩමාන ණය ප්‍රතිපාදන සඳහා වෙන් කිරීම් කර නොතිබීම. |
| (ඈ) | මෙහෙයුම් පාලනය | (i) සීනි උකහා ගැනීමේ ප්‍රතිශතය, උක් ගසෙහි පවතින සීනි ප්‍රමාණය අඩු වීම පිළිබඳව ක්‍රියාත්මක නොවීම.<br>(ii) කර්මාන්තශාලාව උපරිම ධාරිතාවයෙන් ක්‍රියාත්මක කිරීමට කටයුතු නොකිරීම.<br>(iii) ස්කාගාර බලපත්‍රය නිසි ක්‍රමවේදයකට අනුව ලබා ගැනීමට කටයුතු නොකිරීම. |